## බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය

### හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
### කතරගම හින්දු විශ්‍රාම ශාලාවේ භාරකරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට අයත් කතරගම හින්දු විශ්‍රාම ශාලාවේ භාරකරු තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. සේවා කොන්දේසි - තෝරාගනු ලබන අපේක්ෂකයා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සේවයේ III වැනි පන්තියට බඳවා ගනු ලැබේ.

අයදුම්කරු -

III පන්තිය සඳහා පත්කරන ලද දින සිට වසර 3ක ඇතුළත 1වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු ය. II වැනි පන්තිය සඳහා පත්කරන ලද දින සිට වසර 3ක ඇතුළත 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතු ය. I වැනි පන්තිය සඳහා පත්කරන ලද දින සිට වසර 5ක ඇතුළත 3 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතු ය. එසේම 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 පරිදි දෙවැනි රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය.

03. වැටුප් බණ්ඩය හා පරිමාණය :

(i) වැටුප් බණ්ඩය - MN-1-2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුකූලව.
(ii) වැටුප් පරිමාණය-රු.27,140-10x300-11x350-10x495-10x660-රු.45,540/-.

04. සුදුසුකම් :

4.1 අධ්‍යාපන සුදුසුකම්

(i) අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සහිතව එක්වරක දී විෂයයන් 06ක් සමත්විය යුතු ය.

හා

(ii) අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් එක් විෂයයක්වත් සමත් විය යුතු ය. (සාමාන්‍ය පොදු පරීකෂණය හැර).

4.2 වෙනත් සුදුසුකම් :

(i) හින්දු ආගම හා සංස්කෘතිය, දේශීය සංස්කෘතිය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය.

(ii) දෙමළ හා සිංහල භාෂා ප්‍රවීණතාවය සැළකිල්ලට ගනු ලැබේ.

4.3 යෝග්‍යතාවය :

(i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
(ii) මනා චරිතයකින් හා ශරීර සෞඛ්‍යය යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(iii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට (2020.02.29 )වයස අවුරුදු 18ට නොඅඩුවිය යුතු අතර, අවු.30ට වැඩි නොවිය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

05. *අයදුම් කිරීමේ පිළිවෙල :*

මෙම දැන්වීමේ සඳහන් ආකෘතියට අනුව A4(81/2" x 12") ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත් සකස් කර ගත යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය, අධ්‍යක්ෂ, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, අංක 248/1/1, ගාලුපාර, කොළඹ 04 යන ලිපිනයට, 2020.03.01 දා හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම් පත්‍රය බහාලුලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

06. විභාග ගාස්තුව :

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, අධ්‍යකෂ, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව නමට රු. 500 ක මුදල් සාමාන්‍ය ඇණවුමක් සිදු කර එය අයදුම්පතෙහි අදාළ කොටුවේ ඇලවිය යුතු ය.

07. තෝරා ගැනීමේ ක්‍රමවේදය :

7.1 *ලිඛිත විභාගය -*
මෙය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විතය.
(i) බුද්ධි පරීක්ෂණය - ලකුණු 100 (කාලය පැය 01)
(ii) සාමාන්‍ය පොදු පරීක්ෂණය - ලකුණු 100
(කාලය පැය 01)

මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබේ. සම්මුඛ පරීකෂණය සඳහා කැඳවනු ලබන්නේ ලිඛිත විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40ක් ලබාගත් අයදුම්කරුවන් පමණී.

*විභාගය පැවැත්වෙන දිනය.-* මෙම විභාගය 2020 මාර්තු මස කොළඹ දී පැවැත්වේ.
විභාග මාධ්‍යය - මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

08. *විෂය නිර්දේශය.*

(i) සාමාන්‍ය බුද්ධිය - ලකුණු 100 (කාලය පැය 01)
පදගත සංඛ්‍යාත්මක සහ රූපාකර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලුසම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමන සහ ප්‍රතිචාර පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කරගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

(ii) සාමාන්‍ය දැනුම - ලකුණු 100 (කාලය පැය 01)
1. හින්දු ආගම හා සංස්කෘතිය විෂයයන්
2. සාමාජීය හා සංවර්ධන කටයුතු පිළිබඳව
3. වත්මන් ශ්‍රී ලංකාවේ දේශපාලනික හා ආර්ථික කටයුතු පිළිබඳව
4. සාමාන්‍ය පරිපාලන ක්‍රම හා පාරිභෝගික සත්කාරය පිළිබඳව
5. වර්තමාන ලෝකයේ තොරතුරු පිළිබඳව
6. තොරතුරු තාකෂණය

09. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

තෝරාගනු ලබන අයදුම්කරුවන් සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය අධ්‍යක්ෂ, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබේ. අයදුම්කරු සතු අදාළ විෂය දැනුම, අතිරේක සුදුසුකම් හා වෙනත් සාධනයන් සඳහා ලකුණු ප්‍රදානය කරනු ඇත. සම්මුඛ පරීකෂණයේ දී අවම වශයෙන් ලකුණු 40ක් වත් ලබාගත යුතුය.

ඒ. උමාමහේෂ්වරන්,
අධ්‍යක්ෂ.

2020 පෙබරවාරි මස 06 වැනි දින.
248-1/1, ගාලු පාර, කොළඹ - 04
හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

### කතරගම හින්දු විශ්‍රාම ශාලාවේ භාරකරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා අයදුම් පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

1. විභාගය සඳහා භාෂා මාධ්‍යය :

සිංහල - 01
දෙමළ - 02

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2. මුලකුර සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————. මහතා/මහත්මිය/මෙනවිය)

3. සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය) :————.

5. ස්ථිර ලිපිනය :————.
6. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

7. 7.1 උපන් දිනය :————.
7.2 අයදුම්පත් අවසන් කරන දිනට වයස

අවුරුදු මාස දින

8. ස්ත්‍රී/පුරුෂ භාවය :

(0 - ස්ත්‍රී, 1 - පුරුෂ)

9. විවාහක / අවිවාහකභාවය :

(1 - අවිවාහක, 2 - විවාහක) :

10. ජන වර්ගය :

(සිංහල-1, දෙමළ-2, , මුස්ලිම්-3, වෙනත්-4)

11. දුරකතන අංකය :————.

12. සුදුසුකම් :

12.1 අ.පො.ස සාමාන්‍ය පෙළ විභාග තොරතුරු :

| අනු අංකය. | වර්ෂය | විභාග අංකය | විෂය | ප්‍රතිඵලය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

12.2 *අධ්‍යාපන සුදුසුකම්* - අ.පො.ස උසස් පෙළ විභාග තොරතුරු

| අනු අංකය. | වර්ෂය | විභාග අංකය | විෂය | ප්‍රතිඵලය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

12.3 වෙනත් සුදුසුකම් :..............................................................................
..............................................................................

13. ඔබ යම් වරදකට කිසියම් අධිකරණයකින් දඬුවම් ලබා ඇත්ද?
(ඇත්නම් කරුණු දක්වන්න.) :————.

14. විභාග ගාස්තු සඳහා මුදල් ඇණවුම පිළිබඳ තොරතුරු :
1. මුදල් ගෙවන ලද තැපැල් කාර්යාලය :.....................
2. මුදල් ඇණවුම් අංකය හා දිනය :.....................

මුදල් ඇණවුම නිසි පරිදි මෙහි අලවන්න.
(ජායා පිටපතක් තමා සතුව තබා ගත යුතුය.

15. අයදුම්කරුගේ ප්‍රකාශය :
මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. තවද, මා රාජ්‍ය සේවයේ තනතුරකින් පහකරන ලද හෝ තනතුරක් හැරගිය පුද්ගලයෙකු නොවන බව ද ප්‍රකාශ කර සිටිමි. මෙම විභාගය සම්බන්ධයෙන් පවතින නීතිරීති වලට බැඳී සිටීමට හා විභාග නීති රෙගුලාසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනීගියහොත් විභාගය පැවැත්වීමට පෙර, විභාගය පැවැත්වීමේ දී, ඉන්පසු හෝ මාගේ අපේකෂකත්වය අවලංගු කිරීම සඳහා ගනු ලබන ඕනෑම තීරණයකට බැඳී සිටීමට මම එකඟ වෙමි. තව ද, අධ්‍යකෂක, හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් පනවනු ලබන නීති හා රෙගුලාසි වලට එකඟ වන අතර, මෙම තනතුරෙහි පත්වීම සහ රාජකාරි ස්ථානය පිළිබඳ සියලු තීරණ ගැනීමේ අයිතිය එම අධ්‍යකෂකවරයාට ඇති බවද පිළිගනිමි.

16. රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණයි, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.

මෙම ඉල්ලුම්කරු වන .............................................................. මහතා / මහත්මිය / මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ .............................................................. වශයෙන් ස්ථිර / තාවකාලික නිලධාරියෙක් බව ද, ඔහු / ඇයට මෙම පත්වීමේ රාජකාරිය ඉටු කිරීමට හැකියාව ඇති / නොමැති බවද, සඳහන් කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව

දිනය :————.
නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :————.

02-457

Source: Government Gazette (2020.02.14)